# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2193/27 - 2020 සැප්තැම්බර් මස 16 වැනි බදාදා - 2020.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥාපනත**

**ඓතිහාසික සංඛපාල රජ මහා විහාරයේ ඇසළ මහ පෙරහැර මංගල්‍යය - 2020**

175 වන අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති අංක 2153/15 හා 2019.12.12 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාරව වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනතාවගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධව පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

1. **පෙරහැර පවත්වන කාල සීමාව :**

   - 2020 ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2020.09.18 වැනි දින සුභ මොහොතින් සිදු කෙරේ.
   - 2020.09.26 වැනි දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව හා පසුදින දහවල් දානමය පිරිනැමීම ද,
   - 2020.09.27 වැනි දින කුඹල් පෙරහැර ද,
   - 2020.09.28 වැනි දින සළු පෙරහැර ද,
   - 2020.09.29 වැනි දින රන්දෝලි පෙරහැර ද
   - 2020.09.30 වැනි දින ගිණි සිළු පෙරහැර මංගල්‍යය ද,
   - 2020.10.01 වැනි දින මහ පෙරහැර ද,
   - 2020.10.02 වැනි දින දිය කැපීම හා ගම්මඩු ශාන්ති කර්මය ද,
   - 2020.10.03 වැනි දින අළුයම දේව දානය පිරිනැමීමෙන් ඇසළ පෙරහැර නිමා කිරීමට නියමිතය.

1A - G 32902 — 20 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. කඳවුරු ප්‍රදේශ යනු :

- උතුරට : සංඛපාල කන්ද ද, දකුණට : රක්වාන ගඟ ද, නැගෙනහිරට : පෙරහැර මාවත ද, බස්නාහිරට : පෙරහැර මාවත ද යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ.

3. වාහන

3.1. මාගේ හෝ බලයලත් නිලධාරියෙකුගෙන් හෝ ලබාගත් අවසරයකින් තොරව, කිසිවෙකු විසින් මෝටර් වාහනයක්, බයිසිකලයක් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන වෙන් කර ඇති රථ ගාල් පරිශ්‍රයෙන් හැර, වෙනත් කිසිදු ස්ථානයක හෝ උත්සව භූමිය තුළ නතර කර තැබීම හෝ ඇතුල් කිරීම තහනම් කරමි.

3.2 රත්නපුර, ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදි කර ඇති ප්‍රධාන වාහල්කඩ තුළින් විහාර භූමියට වාහන ඇතුළත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

4. ගොඩනැගිලි ඉදි කිරීම -

4.1 මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ ලිඛිත අවසරයක් නොමැතිව, 2020 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින සිට ඔක්තෝබර් මස 03 වැනි දින දක්වා වන කාලය තුළ කඳවුරු ප්‍රදේශය තුළ යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම නොකළ යුතුය.

4.2 එසේ වුව ද, මාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ නියෝග අතුරින්, යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුලු වීම සහ යම් දැන්වීමක් හෝ නාමපුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක, යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක්, ගොඩනැගීමක් සිදු කිරීමට අවසර ලැබෙනු ඇත.

5. සෞඛ්‍යය :-

5.1 යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලා ගත යුතුය.

5.2 බැතිමතුන් සහභාගි කරවීම මහ පෙරහැර පැවැත්වෙන දිනට පමණක් සීමාවන අතර, සෞඛ්‍ය උපදෙස් අනුව පිරිස සහභාගි කරවීම හා ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සැපයිය යුතුය.

5.3 පෙරහැර පැවැත්වෙන අනෙකුත් දිනයන්හි බැතිමතුන්ගේ සහභාගීත්වයෙන් තොරව චාරිත්‍රවලට සීමා වෙමින් කටයුතු කළ යුතු වේ.

5.4 නැටුම් කණ්ඩායම් සඳහා සහභාගි කරන පිරිස සීමා කළයුතු අතර, එම ශිල්පීන් පිළිබඳව තොරතුරු වාර්තාවක් තබා ගැනීම, පෙරහැරට පෙර පරීක්ෂාවට ලක් කිරීම, නවාතැන් සැපයීමේ දී සෞඛ්‍ය උපදෙස් අනුව ක්‍රියා කිරීම සිදුකළ යුතුවේ.

5.5 පෙරහැර සඳහා සහභාගි වන පිරිස් සඳහා සැපයෙන ආහාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අධීක්ෂණයට ලක් කළ යුතු වේ.

5.6 පෙරහැර මංගල්‍යයට පෙර හා පෙරහැර පැවැත්වෙන කාලය තුළ සෞඛ්‍ය සේවා සැපයීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය - උඩවලව, දිස්ත්‍රික් මහ රෝහල - ඇඹිලිපිටිය, මූලික රෝහල - උඩවලව, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

6. වෙළඳාම :

6.1 මාගේ හෝ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යක් සඳහා හෝ දයක මුදල් එකතු කිරීම නොකළ යුතු අතර පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

6.2 කඳවුරු භූමිය තුළ දූනට පවත්නා මල්, පූජා භාණ්ඩ අලෙවි කරන වෙළෙඳ සැල් පෙරහැර පැවැත්වෙන දිනයන්හි ප.ව. 05.00 සිට පෙරහැර ගමන් කර අවසන් වන තෙක් වසා තැබීමට.
කටයුතු කළ යුතු වේ.

**7. යාචකයෝ :**

- හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමියෙන් පිටත වෙන් කර ඇති හෝ සපයනු ලැබ ඇති ස්ථානයන්හි දී මිස, කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙද හැරීමට හෝ අවසර නොමැත.

**8. විදුලිය පහසුකම්:**

- විහාර භූමිය හා පෙරහැර ගමන් මඟ වීදි ලාම්පු හා අමතර ලාම්පු සවි කිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පවරමි.

**9. ජලය :**

- බැතිමතුන්ට අවශ්‍ය පානීය ජලය අමතර ජල ටැංකි යෙදීම බවුසර සඳහා ජලය සපයමින් පහසුකම් සැපයීම ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය උඩවලව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරමි.

**10. ආරක්ෂාව :**

- සියලු ආරක්ෂක කටයුතු පෙරහැර හා බැතිමතුන්ට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම ආරක්ෂක අංශ හා පොලීසිය වෙත පවරමි.

11. **නවාතැන් පහසුකම්** : පෙරහැර සඳහා සහභාගි වන නැටුම් කණ්ඩායම් සඳහා නවාතැන් පහසුකම් කොළඹගෙආර මහා විද්‍යාලය, සංඛපාල ගුණරතන විද්‍යාලය නම් කරන අතර, සෞඛ්‍ය උපදෙස් අනුව එම කටයුතු සිදුකළ යුතු අතර කලාප අධ්‍යාපන කාර්යාලය හා අදළ විද්‍යාලයන්හි විදුහල්පතිවරුන් වෙත පවරමි.

ඉහත අංක 03 සිට 11 දක්වා නියෝග පෙරහැර මංගල්‍යය අවසන් වනතුරු වලංගු වේ.

**මාලනී ලොකුපෝතාගම,**
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය,
කඳවුරු භාර නිලධාරී.

2020 සැප්තැම්බර් මස 15 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

10 - 60

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.